**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 296/2 හා 1984 මැයි මස 07 දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1984 අප්‍රේල් මස 30 දිනැති ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට ආදේශ වශයෙන් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය පිළිබඳ පහත දැක්වෙන ව්‍යවස්ථා සංග්‍රහය පළ කරනු ලැබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
කොළඹ 07,
1988 මැයි මස 27 වෙනි දින.

1 : 1 1971 ඔක්තෝබර් මස 01 වන දින ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය පිහිටුවනු ලැබූ අතර, මේ සම්බන්ධයෙන් ව්‍යවස්ථා සංග්‍රහයක් පළ කරණ ලදී. දැනට සංශෝධිතව ඇති මෙම ව්‍යවස්ථා සංග්‍රහය, අංක 296/2 හා 1984 මැයි මස 07 දින දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබුවාවූ 1984 අප්‍රේල් මස 30 දිනැති ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව ගන්නා ලද හෝ ගැනීමට අදහස් කරන ලද කිසිදු ක්‍රියා මාර්ගයකට හානියක් නොවන පරිදි 1978 සැප්තැම්බර් මස 07 දින සිට ක්‍රියාත්මක වනු ඇත.

1 : 2 මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි " නියමිත දිනය " යනු වෙන් අදහස් වන්නේ 1971 ඔක්තෝබර් 01 දිනයයි.

2. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, එම සේවයේ පහත සඳහන් පන්ති හා ශ්‍රේණි අතුරෙන් කවරකට හෝ පත් කෙරෙන රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත විය යුතුය.

නව ඒකාබද්ධ වැටුප් පරිමාණයන් සහ වැටුප් පියවර වල් 1988 වර්ෂය සඳහා ගිණිය යුත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 387 හි IV පරිශිෂ්ඨය අනුවය.

| පන්තිය | සේවක සංඛ්‍යාව | නව ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය (1989.01.01 දින සිට ක්‍රියාත්මක වේ.) |
|---|---|---|
| I වන පන්තිය ... | 105 ... | රු. 72,000—10 × 3,600—රු. 1,08,000 |
| II වන පන්තිය, I ශ්‍රේණිය ... | 837 ... | රු. 55,200—7 × 2,400—රු. 72,000 |
| (I සහ II ශ්‍රේණි ඒකාබද්ධ) | | |
| II පන්තිය II ශ්‍රේණිය ... | ... | රු. 36,000—15 × 1,200—රු. 54,000 |

සැලකිය යුතුයි :—

(1) වර්ෂයකට රු. 40,800 ... පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් සහ

වර්ෂයකට රු. 51,600 ක් වූ වැටුප් පියවරට එළඹීමට ප්‍රථම (පූර්ණ වෘත්තීය සුදුසුකම්) දෙවන කාර්යක්ෂමතා කඩඉම ද ඇත.

(2) පත් කරනු ලබන පූර්ණ වෘත්තීය සුදුසුකම් ඇති ඉංජිනේරුවරයෙකු වර්ෂයකට රු. 4[illegible],000 ක් වූ වැටුප් පියවරේ තබනු ඇත.

පත් වූ දින සිට වර්ෂ දෙකක් ඇතුළත 1 වැනි කාර්යක්ෂමතා කඩඉම ඉක්මවා උසස්වීම් ලැබීමට සුදුසු වනු වස් නියමිත විභාගයෙන් සමත් වන ලෙස ඔහුට නියමවනු ඇත.

(3) 1981. 11. 01 දින සිට I පංතිය හා (I හා II ශ්‍රේණි ඒකාබද්ධ කළ) II පංතිය අතර 1 : 8 අනුපාතයකින් යුතුව I පංතියේ සේවක සංඛ්‍යාව නිර්මිත වන අතර II පංතියේ සේවක සංඛ්‍යාව, සේවයෙහි ඒකාන්ත අවශ්‍යතා අනුව ද, වාර්ෂික දෙපාර්තමේන්තු ඇස්තමේන්තුවල ප්‍රතිපාදන අනුව ද සංශෝධනය කරනු ලැබීමට යටත් වේ.

3 : 1 මෙම ව්‍යවස්ථා සංග්‍රහයට යාකර ඇති උපලේඛණයෙන් දැක්වෙන තනතුරු සාමාන්‍ය වශයෙන් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් විසින් උසුලනු ලැබේ. ඉංජිනේරු සේවයෙහි නිලධාරීන් එම තනතුරුවලට පත් කිරීම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් පහත දැක්වෙන නියමයකට යටත්ව සිදු කෙරේ :—

3 : 1 : 1 ඉංජිනේරු සේවයේ නිලධාරියෙකු දෙපාර්තමේන්තු ප්‍රධාන තනතුරකට හෝ අමාත්‍යාංශයක ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරකට පත් කිරීම අමාත්‍ය මණ්ඩලය විසින් සිදු කෙරෙන අතර මෙම සේවයෙහි II පංතියේ II ශ්‍රේණියේ කිසිදු නිලධාරියෙකු එම තනතුරකට නම් කරනු නොලැබිය යුතුය.

3 : 1 : 2 ඉංජිනේරු සේවයේ හෝ මෙම ව්‍යවස්ථා සංග්‍රහයට යා කර ඇති උපලේඛණයෙහි දැක්වෙන තනතුරක නැතහොත් තනතුරුවල අට අවුරුදු සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති කිසිදු නිලධාරියකු දෙපාර්තමේන්තුවක නියෝජ්‍ය ප්‍රධාන තනතුරකට පත් නොකළ යුතුය.

3 : 2 යාකර ඇති උපලේඛනයේ ඒ ඒ කණ්ඩායම් යටතේ දක්වා ඇති තනතුරු උසස් කිරීමේ කාර්යයන් සඳහා වෙන් වෙන් වූ ද, විශේෂ වූ ද කණ්ඩායම් ලෙස සැලකිය යුතුය.

3 : 3 ඉංජිනේරු සේවයේ නිලධාරියෙකුගේ සේවා කාලයේ පළමු අවුරුදු අට තුළ, අදාළ නිලධාරියාගේ

ඉල්ලීම පරිදි හෝ ඉංජිනේරු සේවා මණ්ඩලයේ අභිමතය පරිදි හෝ එම නිලධාරියා උපලේඛනයෙහි දැක්වෙන එක් කණ්ඩායමක සිට තවත් කණ්ඩායමකට තාවකාලිකව මාරු කරනු ලැබීමට යටත් වේ. එසේ වුවත් එම නිලධාරියකු එක් කණ්ඩායමක සිට තවත් කණ්ඩායමකට ස්ථිරව මාරු කරනුයේ අදාළ නිලධාරියාගේ කැමැත්ත අනුව පමණි.

4. ඉංජිනේරු සේවයේ I පන්තියට හා II පන්තියේ I හා II ශ්‍රේණිවලට පත් කිරීම හෝ උසස් කිරීම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ලැබේ. මෙම පන්තිවලට පත් කිරීම හෝ උසස් කිරීම පිළිබඳ නිර්දේශ, එසේ පත් කිරීමට හෝ උසස් කිරීමට සුදුසුකම් ලත් නිලධාරීන්ගේ යෝග්‍යතාව සලකා බැලීමෙන් පසු ඉංජිනේරු සේවා මණ්ඩලය විසින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරනු ලැබේ.

5. රාජ්‍ය පරිපාලන විෂය භාර ඇමතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් ඉංජිනේරු සේවා මණ්ඩලය සමන්විත විය යුතු අතර, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් ඉන් එක් සාමාජිකයෙක් විය යුතුය. සෙසු සාමාජිකයන් දෙදෙනා රජයේ අමාත්‍යාංශවල ලේකම්වරුන් වූ ඉංජිනේරුවන් අතරින් හෝ රාජ්‍ය සේවය තුළ හෝ ඉන් බැහැරව සිටින, එහෙත් දැනට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සාමාජිකයන් නොවන කෘතහස්ත ඉංජිනේරුවන් අතරින් හෝ විය යුතුය. මෙම සාමාජිකයන් තිදෙනා අතරින් එක් අයෙක් සභාපති වශයෙන් රාජ්‍ය පරිපාලන විෂය භාර ඇමතිවරයා විසින් පත් කරනු ලබනු ඇත.

6. සේවයේ පරිපාලනය, ඊට අයත් නිලධාරීන් පුහුණු කිරීම, ඔවුන් අවශ්‍ය කටයුතුවල යෙදවීම හා දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් ඉංජිනේරු සේවා මණ්ඩලය වගකිව යුතු වේ.

7. සේවයේ I පන්තියේ පුරප්පාඩු පුරවනු ලබන්නේ II පන්තියේ I ශ්‍රේණියේ නිලධාරීන් උසස් කිරීමෙනි.

8. සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ පුරප්පාඩු පුරවනු ලබන්නේ II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් උසස් කිරීමෙනි. සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරියකු II පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීමට සුදුසුකම් ලැබීම සඳහා පළමුවන කාර්යක්ෂමතා කඩඉමෙන් සාමාර්ථය ලබා තිබීම ද, පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම ද, උපලේඛනයෙහි සඳහන් තනතුරක අවම වශයෙන් දස අවුරුදු සේවා කාලයක් සපුරා තිබීම ද අවශ්‍ය වේ. උපලේඛනයේ සඳහන් තනතුරක නියුක්ත ඉංජිනේරුවකු වශයෙන් සපුරා ඇති නිත්‍ය සේවා කාලය හා අඛණ්ඩව යෙදේ නම්, 1961 අංක 70 දරණ අනිවාර්ය රාජ්‍ය සේවා පනත යටතේ හෝ තාවකාලික තත්ත්වයෙන් හෝ ඉංජිනේරුවකු වශයෙන් වූ සේවා කාලය, සුදුසුකම් ලැබීමේ සේවා කාලය සඳහා ගණන් ගනු ලැබේ.

9. I පන්තියට උසස් කිරීම මූලික වශයෙන් කුශලතාව මත රඳා පවතී. ජ්‍යෙෂ්ඨත්වය සලකා බලනු ලබන්නේ දෙවනුවය.

10 : 1 II පන්තියේ II ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා පත් කිරීම දැන්වීම ප්‍රසිද්ධ කිරීමෙන් අනතුරුව ඉංජිනේරු සේවා මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි වාචික පරීක්ෂණයක ප්‍රතිඵල අනුව හෝ විවෘත තරග විභාගයක හා වාචික පරීක්ෂණයක ප්‍රතිඵල අනුව හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් කරනු ලැබේ.

10 : 2 බඳවා ගන්නා සෑම නවක නිලධාරියකුම, අමුණා ඇති උප ලේඛනයෙහි දැක්වෙන කණ්ඩායම්වලින් එකකට ඉංජිනේරු සේවා මණ්ඩලය විසින් අනුයුක්ත කෙරේ.

11. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි පුරවැසියන් වන්නා වූද, පිළිගත් ආයතනයක ඉංජිනේරු උපාධියක් හෝ ඉංජිනේරු සේවා මණ්ඩලයේ උපදෙස් අනුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි ඒ හා සමාන වෙනත් සුදුසුකමක් හෝ ලබා ඇත්තාවූ ද, අයදුම්කරුවෝ පමණක් II පන්තියේ II ශ්‍රේණියේ පත්වීම් ලැබීමට සුදුස්සෝ වෙති.

12. II පන්තියේ II ශ්‍රේණියට පත් කරනු ලැබීම සඳහා සෑම අයදුම් කරුවකුම, අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට තම වයස අවුරුදු 21 ට වැඩි හා අවුරුදු 35 ට අඩු බවට ද අධ්‍යාපනික අවශ්‍යතා හා චරිතය සම්බන්ධයෙන් නියමිත සුදුසුකම් තමන්ට ඇති බවට ද ඒත්තු ගතහැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

13. සෑම අයදුම්කරුවෙකුම මනා ශරීර ස්වභාවයෙන් හා මනා ඇස් පෙනීමෙන් යුක්ත විය යුතු අතර, සේවය සඳහා ශාරීරික වශයෙන් සෙසු සෑම අයුරකින්ම සුදුසු විය යුතුය. එසේම දිවයිනේ කවර ප්‍රදේශයකට හෝ සේවයට සුදුසු දැයි පරීක්ෂා කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයට භාජනය වන ලෙස ද ඔවුනට නියම කරනු ඇත.

14. එක් වරකදී තෝරා ගනු ලබන නිලධාරීන් සංඛ්‍යාව ඉංජිනේරු සේවා මණ්ඩලය විසින් තීරණය කරනු ඇත.

15. නියමිත දිනයෙහි උපලේඛණගත තනතුරුවලට උසස්වීම් ලැබීමට ඉඩප්‍රස්තා ඇතිව සිටි යටත් කාර්මික නිලධාරියකුට ඉංජිනේරු සේවා මණ්ඩලයේ උපදෙස් පරිදි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් උසස් කිරීමේ පරිපාටිය සංශෝධනය කරන තෙක් එම නියමයන් හා කොන්දේසි අනුවම එම ඉඩප්‍රස්තා තව දුරටත් භුක්ති විඳීමට අවකාශ ලැබෙනු ඇත. දෙපාර්තමේන්තු නිලධාරීන් පත් කිරීම කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසිනි. මෙම ඡේදය

යටතේ දෙපාර්තමේන්තු නිලධාරීන් පත් කිරීම ඉංජිනේරු සේවා මණ්ඩලයේ නිර්දේශ මත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් කරනු ඇත.

16. 10 : 1 ඡේදය යටතේ II පන්තියේ II ශ්‍රේණියට පත් කරනු ලැබූ නිලධාරියකු තුන් වසරක පරිවාස කාල සීමාවක් ගත කළ යුතුවේ.

17. 15 ඡේදය යටතේ II පන්තියේ II ශ්‍රේණියට පත් කරනු ලැබූ නිලධාරියකුට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරනය කෙරෙන කාල සීමාවක් පළමුව එම පන්තියෙහි වැඩ බැලීමට නියම කෙරෙනු ඇත.

18 : 1 10 : 1 ඡේදය යටතේ පත් කරනු ලැබූ නිලධාරියකු සේවයේ ස්ථිර කිරීම, වෙනත් කරුනු අතර ඔහු නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීම හෝ ඉන් නිදහස් කිරීම හෝ මත රඳා පවතිනු ඇත. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පනවා ඇති හෝ මතුවට පනවනු ලබන යම් යම් නීති හා ව්‍යවස්ථා ඇත්නම් ඉන් බැඳී සිටීමට ඔහුට නියම වනු ඇත.

18 : 2 සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන නිලධාරියකු සිංහල ප්‍රවීණතා පරීක්ෂනයෙන් නිදහස් කෙරෙනු ඇත.

19 : 1 වාචික පරීක්ෂණයක හෝ ලිඛිත පරීක්ෂණයක හෝ ප්‍රතිඵල අනුව II පන්තියේ II ශ්‍රේණියට බඳවා ගනු ලැබූ නිලධාරීන් සේවයෙහි ස්ථිර කිරීමෙන් අනතුරුව ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාවය නියම වන්නේ අදාළ වාචික පරීක්ෂණයෙහි දී හෝ ලිඛිත පරීක්ෂණයෙහි දී ඔවුන් පිහිටුවනු ලැබූ කුශලතා අනුපිළිවෙල අනුවය.

19 : 2 කිසියම් නිලධාරියෙක් තම පාලන විෂය නොඉක්මවා සිටි හේතු නිසා නියමිත කාලය ඇතුළත සේවයේ ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමට අපොහොසත් වුවහොත් ඔහුගේ ජ්‍යෙෂ්ඨතාව තීරණය කරනු ලබන්නේ ඔහු සේවයේ ස්ථිර කරනු ලැබීමට සුදුසුකම් ලබන දිනයෙහි සිටය.

20 : 1 II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරියකු වර්ෂයකට රු. 40,800 ක වැටුප් තලයකට එළඹීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු වේ. මේ සඳහා වූ විෂය නිර්දේශය හා විභාග පරිපාටිය ඉංජිනේරු සේවා මණ්ඩලය විසින් නියම කරනු ලබන පරිදි වේ.

20 : 2 දෙපාර්තමේන්තු කාර්ය පරිපාටි හා ස්වකීය විෂය ක්ෂේත්‍රයකට අදාළ නීති හා ව්‍යවස්ථා පිලිබඳ නිලධාරියාට ප්‍රමාණවත් වැටහීමක් ඇති බවට ඔහු සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා සහතික කරන්නේ නම් II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරියකු අවුරුදු 45 වයස් සීමාවට එළඹීමට පළමුවන කාර්යක්ෂමතා කඩඉමට අදාළ නියමිත පරීක්ෂණයෙන් සමත් වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කරනු ලැබේ.

20 : 3 II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරියකු වර්ෂයකට රු. 51,600 ක වැටුප් තලයට එළඹීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් විය යුතුවේ. දෙවන කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කිරීම පිණිස සුදුසුකම් ලැබීම සඳහා ඔහු ඉංජිනේරු සේවා මණ්ඩලය විසින් නියම කරනු ලබන පූර්න වෘත්තීය සුදුසුකමේ ලබා ගත යුතු වේ.

20 : 4 II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරියකු අවුරුදු 45 වයස් සීමාවට එළඹි විට දෙවන කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කිරීම පිණිස සුදුසුකම් ලැබීම සඳහා නියමිත වෘත්තීය සුදුසුකම් ලැබීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. එසේ ද වුවත්, පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබන තෙක් ඔහු II පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා සුදුසු නොවේ.

21. II පන්තියේ II ශ්‍රේණියට පත් කෙරෙන යම් නිලධාරියෙක් පලමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වී නියමිත පූර්ණ වෘත්තීය සුදුසුකම් ලැබුව හොත් මිස හෝ අවුරුදු 45 වයස් සීමාවට එළඹීමෙන් ඉන් නිදහස් කරනු ලැබුවහොත් මිස ඊළඟ කාර්යක්ෂමතා කඩඉමට හෝ ඔහුගේ වැටුප් ක්‍රමයෙහි උපරිම වැටුප් තලයට එළඹීමට පෙර කාලසීමාව තුල ඔහුට පවරනු ලැබිය හැකි කාර්යන් **කාර්යක්ෂමව ඉටු කිරීම** සඳහා ඔහුට සෑම අතින්ම සුදුසුකම් ඇති බවට ඉංජිනේරු සේවා මණ්ඩලය සෑහීමට පත් වුවහොත් මිස කාර්යක්ෂමතා කඩඉම්වලින් ඔබ්බට උසස් කරනු නොලැබේ.

**තනතුරු උපලේඛනය**

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය**

**I වැනි සිවිල් කණ්ඩායම**

(ගොඩනැගිලි)

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | තනතුර |
|---|---|
| පලාත් පාලන නිවාස, හා ඉදිකිරීම් අමාත්‍යාංශය ... | සංවර්ධන අධ්‍යක්ෂ |
| පලාත් පාලන ... ... ... | ප්‍රධාන ඉංජිනේරු |
| | ඉංජිනේරුවරු, සිවිල් |
| ගොඩනැගිලි ... ... ... | අධ්‍යක්ෂ |
| | අතිරේක අධ්‍යක්ෂ |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| | සහකාර අධ්‍යක්ෂවරු |
| | ප්‍රධාන ඉංජිනේරුවරු |
| | අධිකාරී ඉංජිනේරුවරු |
| | ඉංජිනේරුවරු, සිවිල් |

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | තනතුර |
|---|---|
| නාගර හා ග්‍රාම නිර්මාණ ... ... | ඉංජිනේරුවරු, සිවිල් |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ... ... | ඉංජිනේරු, සිවිල් |
| අධ්‍යාපන අමාත්‍යාංශය ... | අධ්‍යක්ෂ, පාසැල් වැඩ<br>අධිකාරි ඉංජිනේරුවරු<br>ඉංජිනේරුවරු, සිවිල් |
| කම්කරු ... ... ... | *නියෝජ්‍ය කොමසාරිස් (තාක්ෂණික) හා ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු<br>*නියෝජ්‍ය ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු<br>*විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු<br>*දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරු<br>කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරු |
| අධිකරණ අමාත්‍යාංශය ... ... | ඉංජිනේරු, සිවිල් |
| විදුලි සංදේශ ... ... ... | ඉංජිනේරු, සිවිල් |
| තැපැල් ... ... ... | ඉංජිනේරු, සිවිල් |

*මෙම තනතුරු 1 වැනි සිවිල් කණ්ඩායමට 1 වැනි හා 2 වැනි විදුලි කණ්ඩායම්වලට හා 1 වැනි යාන්ත්‍රික කණ්ඩායමට විවෘතව ඇත.

### 2 වැනි සිවිල් කණ්ඩායම

### (මහා මාර්ග)

| | |
|---|---|
| මහාමාර්ග අමාත්‍යාංශය ... ... | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු (තාක්ෂණික) |
| මහාමාර්ග ... ... ... | අධ්‍යක්ෂ |

### 3 වැනි සිවිල් කණ්ඩායම

### (ජල හා භූමි සම්පත් සංවර්ධනය)

| | |
|---|---|
| වාරිමාර්ග ... ... ... | අධ්‍යක්ෂ<br>අතිරේක අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>ප්‍රධාන වාරිමාර්ග ඉංජිනේරුවරු<br>විශේෂඥ නිලධාරි, භූවිද්‍යා<br>වාරිමාර්ග ඉංජිනේරුවරු |
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ... ... | ඉංජිනේරු, සිවිල් |
| ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය ... | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජල පාලන) |
| ඉඩම් කොමසාරිස් ... ... | ඉංජිනේරුවරු, සිවිල් |
| කෘෂිකර්ම ... ... ... | *නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු කටයුතු)<br>*අධිකාරි ඉංජිනේරුවරු<br>ඉංජිනේරුවරු, සිවිල්<br>කෘෂිකර්ම ඉංජිනේරුවරු |
| ගොවිජන සේවා ... ... ... | ඉංජිනේරුවරු, සිවිල් |
| කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය ... | ඉංජිනේරු, සිවිල් |

*මෙම තනතුරු 3 වැනි සිවිල් කණ්ඩායමට හා 1 වැනි යාන්ත්‍රික කණ්ඩායමට විවෘතව ඇත.

### 4 වැනි සිවිල් කණ්ඩායම

### (දුම්රිය)

| | |
|---|---|
| දුම්රිය ... ... ... | *අතිරේක සාමාන්‍යාධිකාරි (තාක්ෂණික)<br>ප්‍රධාන ඉංජිනේරු<br>නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු<br>අධිකාරි ඉංජිනේරුවරු, සිවිල්<br>ඉංජිනේරුවරු, සිවිල් |

*මෙම තනතුර 4 වැනි සිවිල් කණ්ඩායමට හා 2 වැනි යාන්ත්‍රික කණ්ඩායමට විවෘතව ඇත.

5 වැනි සිවිල් කණ්ඩායම

(සමුද්‍ර)

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | තනතුර |
|---|---|
| ධීවර අමාත්‍යාංශය ... ... | ඉංජිනේරු, සිවිල් |
| වෙරළ සංරක්ෂණ අංශය ... ... | *ප්‍රධාන ඉංජිනේරුවරු<br>ඉංජිනේරුවරු, සිවිල් |

*මෙම තනතුරු 5 වැනි සිවිල් කණ්ඩායමට සහ 3 වැනි යාන්ත්‍රික කණ්ඩායමට විවෘතව ඇත.

1 වැනි විදුලි කණ්ඩායම

(බැර විදුලි)

| | |
|---|---|
| විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය ... ... | ප්‍රධාන විදුලි පරීක්ෂක |
| විදුලි ... ... ... | ඉංජිනේරුවරු, විදුලි |
| කම්කරු ... ... ... | *නියෝජ්‍ය කොමසාරිස් (තාක්ෂණික) හා ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු<br>*නියෝජ්‍ය ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (විදුලි)<br>*විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු<br>*දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරු<br>කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරු |
| ගොඩනැගිලි ... ... ... | ප්‍රධාන ඉංජිනේරු<br>අධිකාරි ඉංජිනේරු (විදුලි)<br>ඉංජිනේරුවරු, විදුලි |
| වාරිමාර්ග ... ... ... | ඉංජිනේරු, විදුලි |
| දුම්රිය ... ... ... | ඉංජිනේරුවරු, විදුලි |
| අලෙවි සංවර්ධන ... ... ... | ඉංජිනේරු හා අධිකාරි (ශීත ගබඩා) |
| රේෂකර්ම ... ... ... | ඉංජිනේරු, විදුලි |

*මෙම තනතුරු 1 වැනි සිවිල් කණ්ඩායමට 1 වැනි හා 2 වැනි විදුලි කණ්ඩායම්වලට හා 1 වැනි යාන්ත්‍රික කණ්ඩායමට විවෘතව ඇත.

2 වැනි විදුලි කණ්ඩායම

(ලුහු විදුලි)

| | |
|---|---|
| විදුලි සංදේශ ... ... ... | විදුලි සංදේශ අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය විදුලි සංදේශ අධ්‍යක්ෂ (දේශීය)<br>නියෝජ්‍ය විදුලි සංදේශ අධ්‍යක්ෂ (විදේශීය)<br>ප්‍රධාන ඉංජිනේරුවරු (දේශීය)<br>ප්‍රධාන ඉංජිනේරුවරු (විදේශීය)<br>අධිකාරි විදුලි සංදේශ ඉංජිනේරු (දේශීය)<br>අධිකාරි විදුලි සංදේශ ඉංජිනේරු (විදේශීය)<br>විදුලි සංදේශ ඉංජිනේරුවරු (දේශීය)<br>විදුලි සංදේශ ඉංජිනේරුවරු (විදේශීය) |
| දුම්රිය ... ... ... | සංඥා හා විදුලි සංදේශ ඉංජිනේරු<br>අධිකාරි ඉංජිනේරු<br>ඉංජිනේරුවරු (විදුලි) |
| කම්කරු ... ... ... | *නියෝජ්‍ය කොමසාරිස් (තාක්ෂණික) හා ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු<br>*නියෝජ්‍ය ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු<br>*විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු<br>*දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරු<br>කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරු |
| සිවිල් ගුවන් සේවා ... ... ... | සහකාර අධ්‍යක්ෂ (ගගන නාවික විදුලි සංදේශ)<br>**සහකාර ගගන නාවික පරීක්ෂක, 1 ශ්‍රේණිය<br>ඉංජිනේරුවරු, විදුලි |
| ධීවර අමාත්‍යාංශය | |
| වෙරළ සංරක්ෂණ අංශය ... ... | ඉංජිනේරු, විදුලි |
| කෘෂිකර්ම ... ... ... | ඉංජිනේරු, විදුලි |

*මෙම තනතුරු 1 වැනි සිවිල් කණ්ඩායමට, 1 වැනි 2 වැනි විදුලි කණ්ඩායම්වලට හා 1 වැනි යාන්ත්‍රික කණ්ඩායමට විවෘතව ඇත.

**මෙම තනතුර 2 වැනි විදුලි කණ්ඩායමට හා 1 වැනි යාන්ත්‍රික කණ්ඩායමට විවෘතව ඇත.

## 1 වැනි යාන්ත්‍රික කණ්ඩායම

(සාමාන්‍ය)

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | තනතුර |
|---|---|
| මහවැලි සංවර්ධන අමාත්‍යාංශය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (කාර්මික) |
| කෘෂිකර්ම | *නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු කටයුතු)<br>*අධිකාරී ඉංජිනේරුවරු<br>ඉංජිනේරුවරු, යාන්ත්‍රික<br>කෘෂිකාර්මික ඉංජිනේරුවරු |
| රජයේ කර්මාන්ත ශාලාව | කර්මාන්තශාලා, ඉංජිනේරු<br>අධිකාරී ඉංජිනේරු<br>ඉංජිනේරුවරු, යාන්ත්‍රික |
| කම්කරු | **නියෝජ්‍ය කොමසාරිස් (තාක්ෂණික) හා ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු<br>**නියෝජ්‍ය ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු<br>**විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු<br>**දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරු<br>කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරු<br>ව්‍යාපෘති අධ්‍යක්ෂ, වෘත්තීය දක්ෂතා සංවර්ධන මධ්‍යස්ථානය<br>ඉංජිනේරු වෘත්තීය අභ්‍යාස |
| කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| සිවිල් ගුවන් සේවා | සහකාර අධ්‍යක්ෂ (ගගන නාවික)<br>ගගන නාවික පරීක්ෂක<br>***සහකාර ගගන නාවික පරීක්ෂක, 1 ශ්‍රේණිය |
| ගොඩනැගිලි | ඉංජිනේරුවරු, යාන්ත්‍රික |
| ආහාර | ඉංජිනේරු, යාන්ත්‍රික |
| විදුලි සංදේශ | ඉංජිනේරුවරු, යාන්ත්‍රික |
| අලෙවි සංවර්ධන | ඉංජිනේරු, යාන්ත්‍රික |
| වාරිමාර්ග | ඉංජිනේරුවරු, යාන්ත්‍රික |
| ඉඩම් කොමසාරිස් | ඉංජිනේරු, යාන්ත්‍රික |
| රේෂකර්ම | ඉංජිනේරු, යාන්ත්‍රික |
| විදුලි | ඉංජිනේරුවරු, යාන්ත්‍රික |
| කුඩා කර්මාන්ත | ඉංජිනේරු, යාන්ත්‍රික |

*මෙම තනතුරු 3 වැනි සිවිල් කණ්ඩායමට හා 1 වැනි යාන්ත්‍රික කණ්ඩායමට විවෘතව ඇත.

**මෙම තනතුරු 1 වැනි සිවිල් කණ්ඩායමට 1 වැනි හා 2 වැනි විදුලි කණ්ඩායම්වලට හා 1 වැනි යාන්ත්‍රික කණ්ඩායමට විවෘතව ඇත.

***මෙම තනතුර 2 වැනි විදුලි කණ්ඩායමට හා 1 වැනි යාන්ත්‍රික කණ්ඩායමට විවෘතව ඇත.

## 2 වැනි යාන්ත්‍රික කණ්ඩායම

(දුම්රිය)

| | |
|---|---|
| දුම්රිය | *අතිරේක සාමාන්‍යාධිකාරී (තාක්ෂණික)<br>අධ්‍යක්ෂ, (රත්මලාන, ශ්‍රී ලංකා ජර්මානු දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානය)<br>ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු<br>ධාවන බල අධිකාරී<br>නියෝජ්‍ය යාන්ත්‍රික ඉංජිනේරුවරු<br>ප්‍රාදේශීය ප්‍රවාහන අධිකාරිහු (යාන්ත්‍රික)<br>ඉංජිනේරුවරු (යාන්ත්‍රික)<br>සහකාර ප්‍රාදේශීය ප්‍රවාහන අධිකාරිහු (යාන්ත්‍රික) |

*මෙම තනතුර 4 වැනි සිවිල් කණ්ඩායමට හා 2 වැනි යාන්ත්‍රික කණ්ඩායමට විවෘතව ඇත.

## 3 වැනි යාන්ත්‍රික කණ්ඩායම

(සමුද්‍ර)

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | තනතුර |
|---|---|
| ධීවර අමාත්‍යාංශය | නාවික යාන්ත්‍රික ඉංජිනේරු<br>ඉංජිනේරු යාන්ත්‍රික |
| වෙරළ සංරක්ෂණ අංශය | ඉංජිනේරු යාන්ත්‍රික |
| වෙළඳ හා නාවික අමාත්‍යාංශය | රාජ්‍ය ඉංජිනේරු හා නැව් සමීක්ෂක |
| | විවෘත තනතුරු |
| රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | *ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ<br>*ඉංජිනේරු සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ |

*මෙම තනතුරු සියලුම ඉංජිනේරු කණ්ඩායම්වලට විවෘතව ඇත.

6–376/3